# 08 වන අන්තර්ජාතික බෞද්ධ සම්මන්ත්‍රණය
# ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය
# (BUSL-IBC 2024 )

## <u>විස්තාරිත සාරසංක්ෂේප සඳහා මාර්ගෝපදේශ</u>

## විස්තාරිත සාරසංක්ෂේප භාරගන්නා දිනය 2024 සැප්තැම්බර් 20 දක්වා දීර්ඝ කරන ලදී.

ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය මගින් පවත්වනු ලබන 08 වන අන්තර්ජාතික බෞද්ධ සම්මන්ත්‍රණය (BUSL-IBC 2024) සඳහා විස්තාරිත සාරසංක්ෂේප ලබා ගැනීම සිදු කෙරේ. හැඳින්වීම, ක්‍රමවේදය, ප්‍රතිඵල/ දත්ත විශ්ලේෂණය හා සාකච්ඡාව, නිගමනය, මූලාශ්‍රය නාමාවලිය යන අංගයන්ගෙන් ඔබගේ විස්තාරිත සාරසංක්ෂේපය සංවිධානය විය යුතු ය.

විස්තාරිත සාරසංක්ෂේප **MS Word** (.doc) සහ **PDF** (.pdf) යන මෘදු ආකෘති යටතේ සකස් කර ~~2024 සැප්තැම්බර් 01~~ 2024 සැප්තැම්බර් 20 වන දිනට හෝ එදිනට පෙර **ibc@busl.ac.lk** යන ඊමේල් ලිපිනයට එවිය යුතු ය. විමර්ශකවරුන් විසින් අනුමත කරනු ලබන විස්තාරිත සාරසංක්ෂේප ISSN අංකය සහිත සාරසංක්ෂේප ග්‍රන්ථයක් ලෙස ප්‍රකාශයට පත් කරනු ලැබේ.

සම්මන්ත්‍රණය පවත්වනු ලබන ස්ථානයෙහි ලිපිනය වනුයේ ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය, පුත්තලම් පාර, අනුරාධපුර, තැ.අං. 50000 ය.

---

### 01. මූලික උපදෙස්

| | |
|---|---|
| පිටුවේ ප්‍රමාණය සහ පිටු සීමාව: | මූලාශ්‍රය, වගු, රූපසටහන් ඇතුළත්ව සම්පූර්ණ A4, Portrait page orientation පිටු 04 කි. |
| වචන ප්‍රමාණය: | 1000-1200 අතර විය යුතු ය. |
| පේළි අතර පරතරය: | 1.5 පරතරය |
| පිටුවේ වට ප්‍රමාණය: | සෑම පැත්තකින් ම (උඩ, යට, වම, දකුණ) අඟල් එක බැගින් විය යුතු ය. |
| පිටු අංක යෙදීම: | පිටුවේ යට, මධ්‍යයේ |
| භාෂාව: | ඉංග්‍රීසි, සිංහල, පාලි |
| පරිගණක අකුරු වර්ගය: | ඉංග්‍රීසි - Times New Roman,<br>සිංහල - FMAbhaya,<br>පාලි - Times Ext Roman/ FMAbhaya |
| අකුරුවල විශාලත්වය: | මාතෘකාව 14, කතුවරයා/වරුන්ගේ නම/නම්: 12, සම්බන්ධ ආයතනය සහ ප්‍රධාන කර්තෘගේ ඊ-තැපැල් ලිපිනය: 10 *(Italic)*, ඡේද: 12, අනුමාතෘකා 1: 13 බෝල්ඩ් **(bold)**/ අනුමාතෘකා 1.1.: 12 බෝල්ඩ් **(bold)** |

| | |
|---|---|
| මාතෘකාව: | අකුරුවල විශාලත්වය 14, බෝල්ඩ් **(bold)**, මධ්‍යයේ, මාතෘකව වචන 20 ට නොවැඩි විය යුතුය.<br><br>සිංහල හෝ පාලි භාෂාවෙන් රචිත සාරසංක්ෂේපවල මාතෘකාව ඉංග්‍රීසි භාෂාවෙන් ද දැක්විය යුතු ය. |
| අනුමාතෘකා: | අකුරුවල විශාලත්වය ඉහතින් දක්වා ඇති පරිදි, වම්පසට පෙළගස්වා තැබිය යුතු ය. |
| රූප සහ වගු: | රූප/වගු ඇතුළත් කරන්නේ නම් උපරිම ප්‍රමාණය රූප/වගු 03 ක් වන අතර එය දත්ත විශ්ලේෂණයේ විස්තර ඇතුළත දක්වන්නක් විය යුතු ය. පිටුව අග වෙනම නොදැක්විය යුතු ය. වගු/ රූපසටහන්වල මාතෘකාව අකුරු විශාලත්වය 12 විය යුතු අතර ඡේදවල අකුරු වර්ගය ම (same font and size) භාවිත කළ යුතු ය. |

------------------------------------------------------------------------------------------------------------------

## 02. විස්තාරිත සාරසංක්ෂේපයේ ව්‍යුහය

- ඔබගේ පර්යේෂණ පත්‍රිකාව අයත් වන සම්මන්ත්‍රණ අනුතේමාව (තේමාව සහ අනුතේමා ලැයිස්තුව මෙහි අග හෝ පෝස්ටරය මගින් බලා ගත හැකි ය.)

1. පර්යේෂණ මාතෘකාව
2. කතුවරයාගේ/වරුන්ගේ නම/නම්
3. ප්‍රධාන කර්තෘගේ ඊමේල් ලිපිනය

උදාහරණය:

**මාතෘකාව**
**(Title in English)**

ඒ.ඒ. නම[1], බී.බී. නම [2], සී. නම [3]

*[1]සම්බන්ධ ආයතනය, නගරය, තැපැල් අංකය, රට*
*[2] සම්බන්ධ ආයතනය, නගරය, තැපැල් අංකය, රට*
*[3] සම්බන්ධ ආයතනය, නගරය, තැපැල් අංකය, රට*
*correspondingauhtor@email.com

*(සැ.යු.: සම්මන්ත්‍රණය හා සම්බන්ධ සියලු දැනුම්දීම් සඳහා මෙම ඊමේල් ලිපිනය භාවිත කෙරෙයි.)*

4. හැඳින්වීම

   පර්යේෂණයේ පසුබිම, පර්යේෂණ ගැටලුව, සාහිත්‍ය විමර්ශන, අරමුණු සහ වැදගත්කම සහ පර්යේෂණ සීමා ආදිය මෙහි ඇතුළත් කෙරේ.

5. පර්යේෂණ ක්‍රමවේදය

   පර්යේෂණ සැලසුම, දත්ත රැස්කිරීමේ ක්‍රමවේදය, දත්ත විශ්ලේෂණ ක්‍රමය ආදිය පිළිබඳ දක්වමින් අදාළ පර්යේෂණ ක්‍රමවේදය මෙහි දැක්විය යුතුය. නියැදිය, දත්ත රැස්කිරීම් මෙවලම් ආදිය පිළිබඳව ද අවශ්‍ය නම් සඳහන් කළ හැකිය.

6. ප්‍රතිඵල/ සොයාගැනීම් සහ සාකච්ඡාව

පර්යේෂණයේ ප්‍රධාන සොයාගැනීම්/ දත්ත විශ්ලේෂණය කොට දැක්වීම හා ඒවා අර්ථකථනය කරමින් සිදු කරන සාකච්ඡාව මෙහි ඇතුළත් කෙරේ. වගු, රූපසටහන් වේ නම් ඒවා ද මෙහි අන්තර්ගත කොට විස්තර කළ යුතු ය. අවශ්‍ය නම් 'සොයා ගැනීම්' හා 'සාකච්ඡාව' වෙන් කොට දැක්වීම ද කළ හැකි ය.

7. නිගමනය

පර්යේෂණ අරමුණු හා ප්‍රතිඵලවලට අනුව නිගමනය ඉදිරිපත් කිරීම මෙහිදී සිදු කෙරේ. එසේම අනාගත පර්යේෂණ සඳහා මගපෙන්වීම් ද මෙහිදී දැක්විය හැකි ය.

8. මුඛ්‍ය පද

මුඛ්‍ය පද 4-5 අතර ප්‍රමාණයක් විය යුතු අතර ඒවා අකාරාදි පිළිවෙළට දැක්විය යුතු ය.

09. මූලාශ්‍රය සහ උධෘත

- හාවඩ් ශෛලිය (Harvard Style) නිවැරදිව භාවිත කිරීම අනිවාර්ය වේ.
- දැක්විය හැකි උපරිම මූලාශ්‍රය ගණන 06 කි.
- මූලාශ්‍රය අකාරාදි පිළිවෙළට දැක්විය යුතු ය.
- අකුරු විශාලත්වය 12, වම් පසට පෙළගස්වා දැක්විය යුතු ය.
- (මේ සඳහා අනුමත නිවැරදි ක්‍රමවේදය භාවිත නොකිරීම පර්යේෂණ පත්‍රිකාව ප්‍රතික්ෂේප වීමට ද හේතු විය හැකි ය.)

---

## 03. රූපසටහන් සහ වගු

- රූපසටහන්හි මාතෘකාව රූපසටහනට පසුව තිබිය යුතුය. වගුවෙහි මාතෘකාව වගුවට ඉහළින් තිබිය යුතුය.
- රූපසටහන් සහ වගු අදාළ පෙළ සමඟ තිබිය යුතුය.
- රූපසටහන් මාතෘකා: Font-12, Bold, Title case, Centered
- වගු මාතෘකා: Font-12, Bold, Title case, Centered
- වර්ණ: කළු සහ සුදු

---

## 04. පර්යේෂණ අත්පිටපත් පිළිබඳ තීරණ

නියමිත දිනට හෝ එදිනට පෙර යොමු කරන සියලුම සාරසංක්ෂේප විමර්ශන ක්‍රියාවලියකට යොමු කෙරේ. ලේඛන චෞරත්වයෙන් අනූන හා කෘතීම බුද්ධිකෘත අන්තර්ගතයක් ද යන්න පරීක්ෂා කරනු ලැබෙන අතර අන්තර්ගතය තුළ ඇති උපුටාගත් තොරතුරු ප්‍රමාණය සමස්ත අන්තර්ගතයෙන් 20% නොඉක්මවිය යුතු ය.

---

## 05. ප්‍රකාශය

ඉදිරිපත් කරනු ලබන පර්යේෂණ පත්‍රිකාව නවතම පර්යේෂණයක් බවට එකඟ වන ප්‍රකාශ පත්‍රයක් කතුවරුන් විසින් අත්සන් කළ යුතුය. එහි මෙම පර්යේෂණ පත්‍රිකාව මීට පෙර වෙනත් ස්ථානයක ප්‍රකාශයට පත් කර නොමැති බව, එය වෙනත් තැනක ප්‍රකාශනය සඳහා සලකා බලමින් නොපවතින බව සහ ප්‍රකාශන හිමිකම් සහිත තොරතුරු පර්යේෂණ පත්‍රිකාව සඳහා භාවිත කර ඇති බව සඳහන් කළ යුතුය. අවසාන අත්පිටපත පිළිගත් පසු ප්‍රකාශය පිළිබඳ පෝරමය කතුවරයා වෙත යැවෙනු ඇත.

---

## 06. සම්මන්ත්‍රණයේ තේමා

- සම්මන්ත්‍රණයේ ප්‍රධාන තේමාව (Main Theme):

  "Buddhism for Global Well-being and Qualitative Transformation"
  ''ගෝලීය යහපැවැත්ම සහ ගුණාත්මක පරිවර්තනය සඳහා බුදුදහම''

- අනුතේමා (Sub-Themes):

  1. Buddhist Philosophy and Spirituality
     බෞද්ධ දර්ශනය සහ ආධ්‍යාත්මිකත්වය
  2. Buddhist Meditation for Health
     සෞඛ්‍යය උදෙසා බෞද්ධ භාවනාව
  3. Peace and Conflict Resolution
     සාමය සහ ගැටුම් නිරාකරණය
  4. Social Fragmentation and Community Resilience
     සමාජ බෙදීම සහ ප්‍රජාවගේ මානසික ඔරොත්තු දීමේ හැකියාව
  5. Holistic Education Integrating Ethics
     ආචාරවිද්‍යාත්මක සාකල්‍ය අධ්‍යාපනය
  6. Sustainable Economic Practices
     තිරසාර ආර්ථික පිළිවෙත්
  7. Buddhism and Globalization: Challenges and Opportunities
     බුදුදහම සහ ගෝලීයකරණයඃ අභියෝග සහ අවස්ථාවන්
  8. Environmental Sustainability and Eco-friendly Initiatives
     පාරිසරික තිරසරභාවය හා පරිසර හිතකාමී මුලපිරීම්
  9. Heritage Management and Tourism
     උරුම කළමනාකරණය සහ සංචාරක ව්‍යාපාරය
  10. Languages and Critical Studies
     භාෂාව සහ විචාරාත්මක අධ්‍යයන
  11. Buddhism, Technology and AI
     බුදුදහම, තාක්ෂණය සහ කෘතිම බුද්ධිය